www.agaram.lk

NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 09 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 14 ඒකකය |
|---|---|---|

### නිබ්බාන පරමං සුඛං

### I කොටස

- සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පඤ්ච ඉන්ද්‍රියන්ගෙන් අප ලබන සැපයේ ස්වභාවය කුමක්ද?
    (1). වෙනස් වීමයි (3). සදාකාලිකයි
    (2). වෙනස් නොවීමයි (4). සැහැල්ලුයි

02. කෙලෙස් ගිනි සම්පූර්ණයෙන්ම නිවී යාම හැඳින්වෙන්නේ කුමන නමකින්ද?
    (1). නිවන ලෙසය (3). තෘෂ්ණාව ලෙසය
    (2). කෙලෙස් ලෙසය (4). නීවරණ ලෙසය

03. සියලුම දුක් ඇති වීමේ ප්‍රධානම හේතුව කුමක්ද?
    (1). තෘෂ්ණාවයි (2). ව්‍යාධියයි (3). ජරාවයි (4). ජාතියයි

04. බුදු දහමට අනුව පරම සැපත ලෙස ඉගැන්වෙන්නේ කුමක්ද?
    (1). නීරෝගීකමයි (3). මුදල් ලැබීමයි
    (2). ඇති තරම් සතුටු වීමයි (4). නිවනයි

05. දුක්ඛ නිරෝධාර්ය සත්‍යය පිළිබඳව විස්තර කෙරෙන සූත්‍ර දේශනාවකි.
    (1). පත්තකම්ම සූත්‍රය (3). කරණීයමෙත්ත සූත්‍රය
    (2). දම්සක් පැවතුම් සූත්‍රය (4). චූල්ලකම්මවිභංග සූත්‍රය

06. දුක්ඛ සමුදයාර්ය සත්‍යයේ සඳහන් ත්‍රිවිධ තෘෂ්ණාව වන්නේ,
    (1). කාම, භව, විභව (3). අනිත්‍ය, දුක්ඛ, අනාත්ම
    (2). සීල, සමාධි, ප්‍රඥා (4). ශ්‍රද්ධා, ශීල, ත්‍යාග

07. සත්වයාගේ භවය ඇති කිරීමට හේතුවක් වන ස්කන්ධ පහට අයත් වන්නේ මේ අතරින් මොනවාද?
    (1). ලෝභ, දෝස, මෝහ, මද, මාන (3). ඇස, කන, නාසය, දිව, ශරීරය
    (2). රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ (4). රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ

08. දුක්ඛ නිරෝධය අපට හිමි කරදෙන මාර්ගය කුමක්ද?
    (1). ආර්ය අෂ්ටාංගික මාර්ගය (3). භවගාමී මාර්ගය
    (2). චෛතසික මාර්ගය (4). තණ්හා මාර්ගය

Agaram.l - Keep your dreams alive!
Agaram.l - Keep your dreams alive!
agaram.lk



agaram.lk

Agaram.l - Keep your dreams alive!

Agaram.l - Keep your dreams alive!

09. සිතේ සැනසිල්ලට බාධා කරන මහත් වූ ආශාවන් ඇතිකර ගැනීම හැඳින්වෙන්නේ කවර නමකින්ද?

(1). මහේච්ඡතාව නමිනි
(2). අවිජින්නතාව නමිනි
(3). ප්‍රචණ්ඩතාව නමිනි
(4). අල්පේච්ඡතාව නමිනි

10. කෙලෙස් නැතිකර දමූ මහරහතන් වහන්සේ නමක්ගේ දිවිය අවසාන වීම හඳුන්වන්නේ,

(1). ස්කන්ධ පරිනිර්වාණය ලෙසය
(2). ක්ලේෂ පරිනිර්වාණය ලෙසය
(3). චෛතසික පරිනිර්වාණය ලෙසය
(4). භව පරිනිර්වාණය ලෙසය

## II කොටස

- **සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. I. ''නිබ්බාන පරමං සුඛං'' යන්නෙහි අදහස ලියන්න.
II. ත්‍රිවිධ තෘෂ්ණාව පිළිවෙලින් නම් කරන්න.
III. ත්‍රිවිධ තෘෂ්ණාව පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

02. I. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය යනු කුමක්ද?
II. සසර දුක් උපදවන්නේ කෙසේද?
III. දුක්ඛ සත්‍යයේ දුක් හතරක් ලියා දක්වන්න.

03. I. නිවන පිළිබඳ බුද්ධ දේශනාව ලියා දක්වන්න.
II. මහිච්ඡතාව පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
III. සරල ජීවිතයකට හුරුපුරුදු වීමේ ප්‍රයෝජන ලියන්න.

04. I. බුදුරජාණන් වහන්සේ ප්‍රශංසා කොට වදාළ ජීවිතය කුමක්ද?
II. ''සන්තුස්සකෝ'' යන්නෙහි අදහස ලියන්න.
III. ''සුභරෝ'' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

05. I. ''සල්ලවුකවුත්ති'' යන්නෙහි අදහස ලියා දක්වන්න.
II. ජීවිතයක ඉන්ද්‍රිය සංවර කර ගැනීමේ ප්‍රයෝජන ලියන්න.
III. සසර ජීවිතය දුකින් මිදීමට ''නිපකෝ'' ගුණය උපකාර වන ආකාරය පැහැදිලි කරන්න.